ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு
**Ministry of Women and Child Affairs**

06th Floor, Stage II, Sethsiripaya, Battaramulla
Tel: Office: 011- 2186145 (118) / Fax: 011-2187154 /Email :mwcamo9@gmail.com

2026.08.26

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති කර්තෘ /ප්‍රවෘත්ති සංස්කාරක,

**<u>සමාජ මාධ්‍ය හරහා ළමුන් සහ කාන්තාවන්ගේ පුද්ගලික ඡායාරූප සහ ලිංගික දර්ශන මිල දී ගැනීම සහ අලෙවි කිරීමේ මාර්ගගත ජාවාරමක් සම්බන්ධවයි.</u>**

මුහුණුපොත (Facebook) ප්‍රමුඛ සමාජ මාධ්‍ය අවකාශයන් තුළ සමූහ (Groups) මගින් ළමුන්ගේ සහ කාන්තාවන්ගේ ලිංගික දර්ශන සහ පුද්ගලික ඡායාරූප මිලදී ගන්නා සහ මුදලට අලෙවි කරන මාර්ගගත ජාවාරමක් පිළිබඳ අප වෙත වාර්තා වී ඇත.

තවද මේ දිනවල සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් විසින් දැනටමත් මෙම තත්වය පිළිබඳ පරිශීලකයින් දැනුවත් කරමින් ලිපි සහ වීඩියෝ පට විශාල ප්‍රමාණයක්ද ප්‍රචාරය කර ඇත.

ඒ අනුව අප විසින් සිදු කළ මූලික සොයා බැලීම් හරහා අනාවරණය කරගත් කරුණු සහිතව ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය සහ පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත යොමු කර ඇත.

අදාළ සමූහ පරීක්ෂා කිරීමේ දී ඒවා තුළ ව්‍යාජ ගිණුම් හරහා තම සමීපතමයින්ගේ ඡායාරූප සහ වීඩියෝ පට මෙසේ විකිණීමට උත්සාහ කරන බව පෙනුනු අතර තම පවුලේම සාමාජික කාන්තාවන්ගේම ඡායාරූප සහ වීඩියෝ පට මෙලෙස බෙදාහැරීමට උත්සාහ කරන අවස්ථාද නිරීක්ෂණය විය.

එසේම මෙම සමූහ බොහොමයක් විදේශ රටවල සිට මෙහෙයවන බවද හඳුනාගැනීමට හැකිවිය.

ඔබ පවුලේ කාන්තාවන් සහ ළමුන් ඔබ නිවස තුළදීම මෙලෙස අනාරක්ෂිත වීමේ අවදානම පවතින බැවින් දෙමව්පියන් තම දරුවන්ගේ සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ සහ ඔවුන් ඒ හරහා ඇසුරු කරන මිතුරන් පිළිබඳව අවදානයෙන් පසුවන ලෙස කාරුණිකව දැනුම් දෙමු.

තවද ඔබ පවුලේ අයෙකු එවැනි ජාවාරමක ගොදුරක් වන බවට, ඇබ්බැහි වූවෙකු වන බවට නිරීක්ෂණය වුවහොත් ඔවුන් මනෝ සමාජයීය උපදේශනය වෙත යොමු කිරීමට හෝ අනෙකුත් නෛතික සහය ලබා ගැනීමට 1938 සහ 1929 ගාස්තු රහිත උපකාරක සේවා දුරකථන අංක හරහා හැකියාව සළසා දී ඇත.

මෙම තත්ත්වය අප අමාත්‍යාංශයේ පූර්ණ අවධානය යොමු වී ඇති බවත් මේ හරහා කාන්තාවන් සහ ළමුන් වින්දිතභාවයට පත්වීම වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කඩිනම් මැදිහත්වීම් සිදුකරන බවත් මෙමගින් වැඩිදුරටත් දන්වා සිටිමු.

මාධ්‍ය ඒකකය,

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය